# යුරෝපා ඉතිහාසය

## 5.1.1

## කාර්මික විප්ලවය යනු කුමක් ද



# කාර්මික විප්ලවය

## කාර්මික විප්ලවය යනු.......

මිනිසා සිය දෑතින් කළ භාණ්ඩ නිෂ්පාදන ක්‍රියාවලිය යන්ත්‍රසූත්‍ර උපයෝගී කරගනිමින් සිදු කිරීම, කාර්මික විප්ලවයේ ආරම්භය වේ. දශක හයක් පමණ තිස්සේ කාර්මික හා තාක්ෂණික ක්ෂේත්‍රයේ ඇති වූ පුළුල් වෙනසකි. 18 වන සියවසේ අගභාගයේ 19 වන සියවසේ මුල් භාගයේත් බ්‍රිතාන්‍යයේ කර්මාන්ත මහත් විපර්යාසයකට භාජනය විය. මෙම විපර්යාසයේ ස්වභාවය කොතෙක් ද, කොතරම් පළල්ව ව්‍යාප්ත වූයේ ද, යත් ඊට කාර්මික විප්ලවය යන විශේෂ නාමය යොදන්නට විය. විප්ලවයක් යනුවෙන් මූලික වශයෙන් වෙනස් වීමක් යන්න අදහස් කරනු ලැබේ. ඒ අනුව කාර්මික විප්ලවය යන්නෙන් හැඟී යනුයේ කර්මාන්ත පවත්වා ගැනීමේත් සංවිධානයේත් වෙනසක් බව කිව හැකි ය. කවර ලෙසකින් වුවත් විප්ලවය ඉතා වේගවත් වීම හෝ දරුණු වීම අනවශ්‍ය වේ. කාර්මික විප්ලවය යන්න තවදුරටත් විග්‍රහ කරන විට කාර්මික විප්ලවය යනු සමාජයේ සිදුවූ වෙනස්කම් සමුදායකි. මෙම වෙනස් වීම කාර්මික වෙනස්වීම් පමණක් නොවේ. සමාජමය හා බුද්ධිමය අතින් ද වෙනස්කම් රාශියක් ඇතිවිය. කාර්මික විප්ලවය චින්තන ක්‍රමයෙත් විප්ලවයක් විය.



## කාර්මික විප්ලවයේ ආරම්භය

දහ අටවන ශතවර්ෂයේ නව සොයගැනීම් සමග ගෘහ කර්මාන්ත මහා පරිමාණ කර්මාන්ත බවට පත්වෙමින් මුළු නිෂ්පාදන ක්‍රියාවලිය ම යාන්ත්‍රීකරණය වීමත් සමග මුළු සමාජ සංස්ථාවේ ම වෙනසක් සිදු විය. එය ආර්ථික , සමාජ හා දේශපාලන ආදි සියලු ක්ෂේත්‍රවලට විහිදි ගිය එකක් විය. කාර්මික විප්ලවය ලෙස හඳුන්වන මෙම ක්‍රියාවලියට පදනම් වූ සාධක විමසා බලමු.

අන්තර්ගතය :- එච්. ජී. ඉන්ද්‍රා කුමාරි මිය, ගුරු උපදේශිකා - දෙනුවර කලාපය.
පරීක්ෂා කිරීම :- කේ.ඒ. ඩී නිමල් මයා, ශාන්ත ජෝශප් බාලිකා විද්‍යාලය, කොළඹ 14.
සැකසුම :- ටී. එම්. මොරගොඩ මයා. ජාතික තරුණ සේවා සභාව. ( 2017-2018 )

Copyright © www.e-thaksalawa.moe.gov.lk

කාර්මික විප්ලවය මුලින් ම ආරම්භ වන්නේ බ්‍රිතාන්‍යයේ ය. කාර්මික විප්ලවය ආරම්භ වීමට ප්‍රථම බ්‍රිතාන්‍ය කෘෂිකාර්මික රටකි. කාර්මික විප්ලවය ආරම්භ වන අවස්ථාව වන විට බ්‍රිතාන්‍යයේ ජන සංඛ්‍යාව ශීඝ්‍ර ලෙස වර්ධනය වෙමින් පැවැතුණි. මෙසේ ජන සංඛ්‍යාව වැඩි වීම උපත් අනුපාතිකය වැඩිවීමේ ප්‍රතිඵලයක් නොවී ය. ඊට හේතු වූවා යැයි සලකන්නේ මරණ අනුපාතයේ ඇති වූ අඩු වීමකි. ඒ සඳහා හේතු බොහෝ දැක්වෙයි.

* ආහාර සුලභ වීම
* පෝෂ්‍යදායි ආහාර ලැබීම නිසා ප්‍රතිශක්තිය වැඩි වීම
* පෞද්ගලික සෞඛ්‍ය දියුණු වීම
* පිරිසිදු ජලය සැපයීම
* ආරක්ෂිත නිවාස
* පරිසරය පවිත්‍ර වීම
* වෛද්‍ය පහසුකම් වර්ධනය වීම

ජන සංඛ්‍යාව වැඩි වීම නිසා භාණ්ඩ සඳහා ඉල්ලුම වැඩි විය. එය වක්‍රව කර්මාන්ත ප්‍රසාරණයට හේතු වූ බව දක්වයි. ඉල්ලුම වැඩි වීම නිසා ආහාර නිෂ්පාදනය වැඩි කිරීමට වගා බිම් ප්‍රමාණය ද වැඩි කරන ලදි. මේ නිසා ප්‍රාග්ධනය ද වැඩි වන්නට විය. මූලික අවශ්‍යතා ඉටු කර ගැනීමට වඩා කෘෂි කර්මාන්තය නිසා වැඩි ආදායමක් ලැබුණු කණ්ඩායමක් බිහි විය. මේ අය වැඩි ධනය ඉතිරි කිරීමට පුරුදු විය. එම ධනය ප්‍රාග්ධනය ලෙස යොදා ගැනීමට හැකි විය. විදේශ ආධාර හෝ ණය ලබා ගැනීමට මෙකල නොහැකි වූ අතර කෘෂි ප්‍රාග්ධනය නොතිබෙන්නට කාර්මික සංවර්ධනය ඇති නොවන්නට ද ඉඩ තිබුණි.

කර්මාන්ත සඳහා වූ ප්‍රාග්ධනය සපයා ගැනීම කෙසේ වී දැයි සලකා බලමු. වෙළෙඳාමේ යෙදෙන අය තම ලාභය නැවත ආයෝජනයට යොමු කරවී ය. මෙම ක්‍රමයට වඩා මනාව සංවිධානය වූ බැංකු ක්‍රමයක් තිබුණි නම් බොහෝ දුෂ්කරතා මඟ හැරීමට ඉඩ තිබුණි. 1694 වන විටත් එංගලන්ත බැංකුව ස්ථාපිතව තිබුණි. ඔවුන් රජයට වෙළෙඳුන්ට හා වෙළෙඳ සමාගම්වලට උදව් උපකාර කරනු ලැබී ය. ඔවුන් තම බැංකුවේ ශාඛා පිහිටවීමට අකමැති වීම ගැටලුවක් විය.1716 වන විට ප්‍රදේශීය බැංකු පිහිටුවීමේ කටයුතු ආරම්භ කරන ලදි. 1793 වන විට ගම්බද ප්‍රදේශවල බැංකු 400 ක් පමණ තිබුණි. මෙසේ පිහිටුවනු ලැබූ බැංකුවලින් සිදු වූ සේවාවක් වූයේ කාර්මික විප්ලවයට අවශ්‍ය මුදල් එකතු කර ඉල්ලුමක් ඇති ප්‍රදේශවලට ලබා දීම ය. මේ ආකාරයට කාර්මික විප්ලවය ආරම්භ වීම කෙරෙහි වෙළඳාම හා බැංකු ක්‍රමයේ වර්ධනය ද ඉවහල් වූ බව කිව හැකි ය.

අන්තර්ගතය :- එච්. ජී. ඉන්ද්‍රා කුමාරි මිය, ගුරු උපදේශිකා - දෙනුවර කලාපය.
පරීක්ෂා කිරීම :- කේ.ඒ. ඩී නිමල් මයා, ශාන්ත ජෝශප් බාලිකා විද්‍යාලය, කොළඹ 14.
සැකසුම :- ටී. එම්. මොරගොඩ මයා. ජාතික තරුණ සේවා සභාව. ( 2017-2018 )

Copyright © www.e-thaksalawa.moe.gov.lk